**ශීර්ෂය 142 - ජාතින උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේවූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපතිවාර්තාව - 2013 වර්ෂය**

---

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

**1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**
**2 කොටස - එක් එක් ශිර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

**1 කොටස**

**ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| **ශිර්ෂය** | **දෙපාර්තමේන්තුව** |
|---|---|
| 207 | පුරා විද්‍යා දෙපාර්තමේන්තුව |
| 208 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව |
| 209 | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 03 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,655,774,595 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. 1,187,789,245 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා එක් එක් දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු. 49,558,503 ත් රු.231,188,439 ත් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6.65 ත් සියයට 61.46 ත් අතර පරාසයක පැවැතුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| 142 | 329,260,000 | 195,973,414 | 133,286,586 | 40.48 |
| 207 | 745,204,595 | 695,646,092 | 49,558,503 | 06.65 |
| 208 | 205,170,000 | 151,218,178 | 53,951,822 | 26.30 |
| 209 | 376,140,000 | 144,951,561 | 231,188,439 | 61.46 |
| එකතුව | 1,655,774,595 | 1,187,789,245 | 467,985,350 | 28.26 |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 03 කට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 14201 | 4,500,000 | 4,144,215 | 1,700,000 | 3,388,488 | 28,000,000 | 9,672,594 |
| 20701 | 50,000,000 | 32,585,044 | 23,000,000 | 30,093,808 | 150,000,000 | 26,349,687 |
| 20801 | 9,000,000 | 9,323,152 | 4,500,000 | 7,786,378 | 45,000,000 | 23,409,100 |
| 20901 | 6,000,000 | 3,466,234 | 2,500,000 | 3,022,403 | 24,000,000 | 16,548,352 |

## 2.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### 2.3.1 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.6,557,969 ක් විය. විස්තර පහත දැක්වේ

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය | 7002/0000/00/0421/0013/000 | 4,480,000 |
| පුරා විද්‍යා දෙපාර්තමේන්තුව | 7002/0000/00/0150/0013/000 | 2,050,061 |
| ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | 7002/0000/00/0149/0013/000 | 27,908 |
| **එකතුව** | | **6,557,969** |

### 2.3.2 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශංශය යටතේ වන දෙපාර්තමේන්තු 03 ක 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.133,129,051 ක් විය. විස්තර පහත දැක්වේ

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය | 6000/0000/00/0015/0183/000 | 4,583,274 |
| පුරා විද්‍යා දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0089/000 | 99,788,458 |
| ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0091/000 | 24,200,768 |
| ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0090/000 | 4,556,551 |
| **එකතුව** | | **133,129,051** |

**2 කොටස**

-----------

**එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

1. **ශීර්ෂය 142 - ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය.**

1.1 **විගණන විෂය පථය**

ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 26 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3** **විගණන නිරීක්ෂණය**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු

නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 3 ක් සඳහා සළසා තිබුණු රු.2,150,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 15 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම නිසා එම වැය විෂයවලින් උපයෝජනයන් කළ පසු ඉතිරිය, ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 72 සිට සියයට 97 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී 142-2-3-15-2502 දරන වැය විෂයයට වෙනත් වැය විෂයයන්ගෙන් රු.10,000,000 ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව ලබා ගෙන තිබුණත්, එසේ ලබා ගත් ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මුළුමණින්ම ඉතිරි වි තිබුණි.

**(ආ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

2013 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පරිගණක සටහන් අනුව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හර ශේෂය හා අමාත්‍යාංශයේ රජයේ නිලධාරීන්ට ණය හා අත්තිකාරම් පාලන ගිණුමෙහි හර ශේෂය අතර රු. 1,000,627 ක වෙනසක් පැවතුණි.

## 1.4 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශය සතු වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර තිබුණු මෝටර් රථ 5 ක් 2011 වර්ෂයේ සිට සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ පරිහරණය සඳහා යොදවාගෙන තිබුණි. එසේ වුවත් මෙම වාහන සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය වෙත විධිමත්ව පවරා දීමට 2014 ඔක්තෝබර් මාසය අවසානය වන විටත් නිම කර නොතිබුණි.

(ආ) **වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර තිබෙන මෝටර් රථ 2 ක් හා කැබ් රථ 3 ක් විධිමත්ව පවරා ගැනීමෙන් තොරව ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ පරිහරණය සඳහා 2011 වර්ෂයේ සිට යොදවා ගෙන තිබුණි. තවද මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර තිබුණු ජීප් රථයක්ද විධිමත් පරිදි පවරා ගැනීමෙන් තොරව ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ පරිහරණය සඳහා යොදවාගෙන තිබුණි.

## 1.5 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| (i) II පරිච්ඡේදය 10.5 වගන්තිය | - | 2013 මාර්තු 25 දිනැති අංක. NH/1/3/5/28 දරන ලිපිය මගින් ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම් (කම්කරු සබඳතා ) - (ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නොවන) තනතුර සඳහා පත්කර තිබූ නිලධාරියාගෙන් වෛද්‍ය පරීක්ෂණ වාර්තාව ලබාගෙන නොතිබුණි. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 231, 237(අ) හා 264(1) | 20,000,000 | ජනකලා කේන්ද්‍රයේ යටිතල පහසුකම් සංවර්ධනය හා ගොඩනැගිලි ඉදිකිරීම සඳහා බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත සහ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත ගෙවීම් කළ වවුචරය සමග |

| | | | |
|---|---|---|---|
| | | | ගෙවීමට අදාල සියළු විස්තරද, සතුටුදායකව කාර්ය ඉටුකළ බවට වූ සහතික කිරීම් හා ගෙවීමට අදාල කුවිතාන්සි ද ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 447(1) හා (5) | - | විසර්ජන (සම්මත) වැය ලෙජරයේ සමාලෝචිත වර්ෂයට අදාල බැඳීම් සටහන් කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 756(1) හා (4) | - | ඉකුත් වර්ෂවලදී හා 2013 වර්ෂයේදී ජනකලා කේන්ද්‍රයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මෙන්ම 2013 සැප්තැම්බර් 30 දින විශේෂ භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර තිබුණද, එදිනට ජනකලා කේන්ද්‍රයේ පුස්තකාල පරිග්‍රහණ ලේඛනයේ ඇතුළත් පොත් 2,927 ක් සමීක්ෂණයකට ලක්කර නොතිබුණි. |

(ඇ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**
----------------------------

| | | |
|---|---|---|
| 1980 අප්‍රේල් 01 දිනැති අංක 162 දරන චක්‍රලේඛයේ 05 හා 07 ඡේද සහ 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන චක්‍රලේඛයේ 2.1 ඡේදය | - | 2013 මාර්තු 25 දින අමාත්‍යාංශයට පත්වීම් ලබා පැමිණි සහකාර ලේකම් (කම්කරු සබඳතා) – (ශ්‍රී.ල.ප.සේ.නොවන නිලධාරියා) 2014 මැයි 19 දින දක්වා තම පැමිණීම, පැමිණීමේ ලේඛනයේ හෝ ඇඟිලි සටහන් මගින් තහවුරු කර හෝ නොතිබුණි |

**1.6 කාර්යසාධනය**
----------------

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**
------------------------------------------------------

2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව නැගෙනහිර පළාතේ ඇති පුරා විද්‍යා ස්ථාන හඳුනාගෙන ඒවා ගැසට් මගින් ස්මාරක හා සංරක්ෂිත භූමි වශයෙන් ප්‍රකාශයට පත්කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 5.5 ක්ද, අම්පාර දිස්ත්‍රික්කයේ හඳුනාගත් පුරා විද්‍යා ස්ථානවල නාමපුවරු යෙදීමේ ව්‍යාපෘති සඳහා රු. මිලියන 4.5 ක්ද වශයෙන් 2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් රු.මිලියන 10 ක ප්‍රතිපාදන සළසා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේදී සමස්ථ නැගෙනහිර පළාතම ආවරණය වන පරිදි මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී අම්පාර දිස්ත්‍රික්කයේ පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි.

(ආ) "දැයේ උරුමය දරුවන්ටයි " යන තේමාව යටතේ පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා 2013 වර්ෂයේ දී රු.මිලියන 2.5 ක ප්‍රතිපාදන සළසා තිබුණි. හම්බන්තොට, අම්පාර හා මොනරාගල යන දිස්ත්‍රික්කවල සහ බස්නාහිර පළාතේ දහම් පාසල් දැනුවත් කිරීම ඇතුළුව වැඩසටහන් 10 ක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේදී වැඩසටහන් 10 ක් සඳහා රු.730,483 ක් වැයකර තිබුණු අතර එය 2013 වර්ෂයේ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 30 ක් විය. එමෙන්ම වැඩසටහන් අවලංගු කර තිබූ අතර පැවැත්වීමට යෝජිතව තිබූ වැඩසටහන් 02 ක් ඉදිරියට කල්දමා තිබුණද පසුව ඒවා පවත්වා නොතිබුණි.

(ඇ) "දැයේ උරුමය දරුවන්ටයි " යන තේමාව යටතේ පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාව මගින් අරමුණුගත එක් ප්‍රධාන කාර්යයක් වූයේ ජාතික උරුම ශිෂ්‍ය සංසද පිහිටුවීමයි. ඒ සම්බන්ධව 2012 අප්‍රේල් 04 දිනැති ලිපිය මගින් සියලු පාසල් වෙත (6-13 ශ්‍රේණි) උපදෙස් මාලාවක් ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය විසින් නිකුත් කර තිබුණි. ඒ අනුව පාසල් මට්ටමින් පිහිටුවන ලද ශිෂ්‍ය සංසද පිළිබඳ තොරතුරු ලබාදෙන ලෙසද දන්වා යවා තිබුණි. නමුත් වසර 2 කට ආසන්න කාලයක් ගතවී තිබියදීත් ශිෂ්‍ය සංසද 09 ක තොරතුරු පමණක් ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය වෙත ලැබී තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ අරමුණු හා සමගාමී වූ මෙම වැඩසටහන සම්බන්ධව ප්‍රමාණවත් පසුවිපරමක් සිදුකර නොතිබුණි.

## 1.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

අමාත්‍යාංශයේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාණවලදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජනකලා කේන්ද්‍රයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සළසා නොමැති විට අයවැය සහය සේවා හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතියෙන් ප්‍රතිපාදන ලබා ගැනිමට කටයුතු නොකර පුරාවිද්‍යා උරුම සංරක්ෂණය සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලට ලැබී තිබුණු රු.මිලියන 20 ක් ඒ සඳහා යොදා ගෙන තිබුණි.

(ආ) ජාතික උරුමයන් පිළිබඳ වාර්තාමය වැඩ සටහන් මගින් පාසැල් සිසුන් දැනුවත් කිරීම අරමුණු කර වඩාත් නවීකරණය කරන ලද වැඩ සටහනක් නිෂ්පාදනය කිරීම සඳහා එම කාර්යය පෞද්ගලික ආයතනයක් වෙත පැවරීමට 2013 වර්ෂයේ අවසන් කාර්තුවේදී අමාත්‍යාංශය තීරණය කර තිබුණි. එම වාර්තාමය වැඩ සටහන් නිෂ්පාදනය කිරීමේ

සම්පත් (භෞතික හා මානව) අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකය තුළ පැවතියත් එම සම්පත් උපයෝගීකර ගැනීමෙන් තොරව 2014 පෙබරවාරි 06 දිනැති ලිපිය මගින් රු.150,000 ක මිල ගණන් මත ඉහත ආයතනයට කාර්යයන් පවරා තිබුණි. 2014 සැප්තැම්බර් මාසය අවසන් වන විටද එම වාර්තාමය වැඩ සටහන ඇතුළත් විද්‍යුත් තැටිය අමාත්‍යාංශය වෙත ලබාගෙන නොතිබුණි.

(ඇ) 2011 පෙබරවාරි 02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණයක් අනුව පුරා විද්‍යා සංරක්ෂණ හා ජාතික උරුමයන් සුරැකීම පිළිබඳ කටයුතු ඉටුකිරීම සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල උපයන ආදායමෙන් සියයට 25 ක් ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය වෙත ලබාදීමට අනුමැතිය දී තිබුණි. අමාත්‍යාංශයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන සළසා දෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් ලබාදෙන මුදල් වැයකළ නොහැකි වුවද, අමාත්‍යාංශය විසින් භාණ්ඩාගාර අරමුදල් ලැබුණු පසු නිරවුල් කිරීමේ පදනම මත මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් ලැබුණු රු.23,089,235 ක් එම වැඩ සටහන් සඳහා වැය කර තිබූ අතර එයින් රු.12,089,235 ක් 2013 දෙසැම්බර් 31 දිනටද නිරවුල් කර නොතිබුණි.

## 1.8 කළමනාකරණ අකාර්යක්ෂමතා

2006 ජනවාරි 10 දින පැවති අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව එක් එක් ආයතන සම්බන්ධව පිහිටුවනු ලබන පසු විපරම් කමිටු තුළින් අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 10 දිනැති සටහනෙහි අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමත් ආයතනවල පරිපාලන කටයුතු සඳහා කාර්ය මණ්ඩල නියෝජිතයන් සහභාගී කරවා ගැනීමත් අරමුණු කරගෙන තිබුණි. ඒ සඳහා අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතනවල වෘත්තීය සමිති සම්බන්ධීකරණ කටයුතු විධිමත් කිරීම අපේක්ෂා කර තිබුණි. එසේ වුවද, අමාත්‍යාංශය විසින් පසු විපරම් කමිටු ආයතන 2 ක් සඳහා පමණක් පිහිටුවා තිබුණු අතර ආයතන 4 ක් සඳහා 2013 දෙසැම්බර් 31 දින වන විටත් පසු විපරම් කමිටු පිහිටුවා නොතිබුණි.

## 1.9 අවිධිමත් ගනුදෙනු

### රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

අවුකන හා මාලිගාවිල බුද්ධ ප්‍රතිමා සඳහා ආවරණ වහල ඉදිකිරීමේ එක් එක් කාර්යය සඳහා රු.මිලියන 15 බැගින් වූ පිරිවැය ඇස්තමේන්තු වටිනාකම යටතේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව හා රජයේ කර්මාන්ත ශාලාව මගින් මිල ගණන් කැඳවා එම මිල ගණන් ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති තාක්ෂණ ඇගැයීම් කමිටුව වෙත

යොමු කර නිර්දේශ ලබාගත යුතු බව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් නිර්දේශ කර තිබුණි. නමුත් ඉන් බැහැරව රජයේ කර්මාන්ත ශාලාව වෙත සෘජුව කොන්ත්‍රාත්තුව පවරා ඉදිකිරීම් ආරම්භ කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව යටතේ එක් එක් ඉදිකිරීම් කාර්යය සඳහා රු.මිලියන 15 බැගින් වූ පිරිවැය ඇස්තමේන්තුවලට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණත්, සෘජු කොන්ත්‍රාත් පිරිනැමීම යටතේ එක් එක් ඉදිකිරීම වෙනුවෙන් රු.18,424,000 බැගින් වූ පිරිවැය වටිනාකමට රජයේ කර්මාන්ත ශාලාව වෙත කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි.

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශයට පටහැනිව රජයේ කර්මාන්ත ශාලාව වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසුව ප්‍රමාද වී ගිවිසුම අත්සන් කර තිබුණු අතර අනෙක් ආවරණ වහලය ඉදිකිරීම සඳහා කර්මාන්ත ශාලාව සමග අවබෝධතා ගිවිසුමකට එළඹ නොතිබුණි.

එමෙන්ම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(1) මාර්ගෝපදේශයට පටහැනිව ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවල වටිනාකමෙන් සියයට 20 ක උපරිම සීමාව ඉක්මවා පිළිවෙලින් සියයට 38 ක් හා සියයට 27 ක් හෙවත් රු.7,000,000 ක් හා රු.5,000,000 ක් බැගින් අත්තිකාරම් ගෙවා තිබුණි. අත්තිකාරම් ගෙවීම සඳහා අමාත්‍යාංශය විසින් කොන්ත්‍රාත්කරු ගෙන් පිළිගත හැකි අත්තිකාරම් සුරක්ෂණයක්ද ලබාගෙන නොතිබුණි.

## 1.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 11 | 01 |
| තෘතීයික මට්ටම | 03 | 02 | 01 |
| ද්විතීයික මට්ටම | 47 | 36 | 11 |
| ප්‍රාථමික මට්ටම | 24 | 23 | 01 |
| වෙනත් | 04 | 02 | 02 |
| **එකතුව** | **90** | **74** | **16** |

සමාලෝචිත වර්ෂය අවසානය වන විට පුරප්පාඩු 16 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

## 2. ශීර්ෂය 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 17 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 802 ප්‍රකාරව වාහන ලේඛනයක් පවත්වා නොතිබුණි.

**(ආ) විගණන සාක්ෂි නොවීම**

2014 අප්‍රේල් 7 දිනැති අංක TM/B/ACH/Info/2014/08 දරන තොරතුරු කැඳවුම් ලිපියෙන් උතුරු මැද පළාත් කාර්යාලය පිහිටි භූමිය හා ගොඩනැගිල්ල පිළිබඳ තොරතුරු ඉල්ලා තිබුණත්, එම තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) විගණන විමසුම්වලට පිළිතුරුදීම.**

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 11 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 03 කට 2014 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**(ඈ) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.5,577,110 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම්**

2013 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 02 ක් ඉක්මවූ රු.7,736,012 ක්වූ තැන්පතු 23 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර 2014 දෙසැම්බර් 29 දින වන විට එම වටිනාකම රු.202,889 ක්ව පැවතුණි.

**(ඊ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** විෂය අංක 20701 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.3,718,849 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව නිලධාරීන් 12 දෙනෙකුගේ 2013 දෙසැම්බර් 31 දින වන විට ආපදා ණය ශේෂ රු.250,000 ක සීමාව ඉක්මවා තිබුණි.

## 2.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

**වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම.**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 15 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2014 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. කාර්යාලයේ 2009 වර්ෂයෙන් පසු වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදු කර නොතිබුණි.

## 2.6 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| **(i)** මුදල් රෙගුලාසි 715(2) | භාණ්ඩ භාරගැනීම, භාරයේ තබා ගැනීම, නිකුත් කිරීම යන කාර්යයන් ගබඩා භාරකරුවෙකු මගින් සිදුවිය යුතු වුවත්, ප්‍රධාන කාර්යාලයේ පිහිටි ගබඩාව සඳහා 2014 ඔක්තෝබර් දක්වා විධිමත් පරිදි ගබඩා භාරකරුවෙකු පත්කර නොතිබුණි. |
| **(ii)** මුදල් රෙගුලාසි 751 | රජයේ දෙපාර්තමේන්තුවලට ලැබෙන සියළුම භාණ්ඩ බඩු ලේඛන පොතෙහි ඇතුළත් කළ යුතු වුවත්, 2013 මැයි මාසයට පසුව මිලදී ගන්නා ලද පාරිභෝජන ද්‍රව්‍ය, ලේඛනයේ ක්‍රමවත්ව ඇතුළත් කර නොතිබුණි. |

## 2.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ආරම්භ නොකිරීම.

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය<br>රු. | ආරම්භ කළ යුතු දිනය | ආරම්භ නොකිරීමට හේතු |
|---|---|---|---|---|
| (i) | වලස්මුල්ල අතුබෝදේ විහාරයේ විහාර ගෙය සංරක්ෂණය | 2,011,831 | 2013.05.07 | 2015 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබිම. |
| (ii) | කලාප කාර්යාලයක් හා ගබඩා ගොඩනැගිල්ලක් ඉදිකිරීම. අලකේෂ්වර වැඩබිම | 1,281,188 | 2013.06.15 | ගොඩනැගිලි සැලැසුම අනුමත කර නොතිබිම. |
| (iii) | විජයාරාම පුරා විද්‍යා ස්ථානයේ පැරණි දාගැබ හා වේදිකා බැම්ම සංරක්ෂණය | 2,014,637 | 2013.01.01 | වෙනත් ව්‍යාපෘතියකට ප්‍රතිපාදන වැය කිරීමට සිදුවීම. |
| (iv) | තෝලංගමුව විහාරයේ ධර්ම | 3,071,007 | 2013.04.01 | දැව සපයා ගැනීමේ ගැටළු ඇති වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | ශාලාව සංරක්ෂණය | | | |
| (v) | මන්නාරම කොටුව මිනුම සැලැසුම් කිරීම | 137,500 | 2013.04.22 | හේතු දක්වා නැත. |
| (vi) | බුදුරුවගල කෞතුකාගාර ගොඩනැගිල්ලේ වහලය නඩත්තු කිරීම | 1,358,803 | 2013.02.15 | ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු පත්කිරීමේ ගැටළු ඇති වීම. |
| (vii) | බුදුරුවගල ක්ෂේත්‍ර නිවාස ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම | 352,429 | 2013.01.15 | හේතු දක්වා නැත. |
| (viii) | කිරිඔරුව අම්බලම සංරක්ෂණය | 165,888 | 2013.02.12 | ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු පත්කිරීමේ ගැටළු ඇති වීම. |
| (ix) | පස්සර විහාරයේ පිළිමගෙයි ආරක්ෂක බැම්ම නඩත්තු කිරීම. | 109,850 | 2013.01.20 | ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු පත්කිරීමේ ගැටළු ඇති වීම. |
| (x) | අම්බලන්තොට වැලිපටන්විල ගංගාරාමයේ ධර්ම ශාලාව සංරක්ෂණය | 4,340,860 | 2013.05.07 | මුදල් වෙනත් කාර්යයක් සඳහා යොදවා ගැනීම. |

**(ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරිම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්කගත දිනයන් සඳහන් කර තිබුණද භෞතික ප්‍රගති වාර්තාවට අනුව එම ව්‍යාපෘති අදාළ ඉලක්කගත දිනයයන් තුළ ඉටු කිරීමට නොහැකි වි තිබුණි.

| | **ව්‍යාපෘතිය** | **ඇස්තමේන්තු ගත පිරිවැය** | **ආරම්භ කළ දිනය** | **නිම කළ යුතු දිනය** | **2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය** | **2013 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය** | **ප්‍රමාදයට හේතු** |
|---|---|---|---|---|---|---|---|
| | | **රු.** | | | **සියයට** | **සියයට** | |
| (i) | නුපේ පැරණි වෙළඳ මධ්‍යස්ථානයේ අළුත්වැඩියාව | 2,204,225 | 2013.02.01 | 2013.12. 31 | 58 | 50 | හේතු දක්වා නැත. |
| (ii) | තියඔරාහේන පත්තිනි දේවාලය නඩත්තු කිරීම | 3,469,173 | 2013.07. 31 | 2013.12. 31 | - | 25 | හේතු දක්වා නැත. |
| (iii) | යුධගනාව දාගැබ ව්‍යාපෘතිය | 10,000,000 | 2013.03.30 | 2013.12. 10 | 35 | 30 | ගඩොල් සැපයීම ප්‍රමාද වීම. |
| (iv) | රුවන්වැල්ල, ප්‍රාකර බැමි හා ජුබිලි අම්බලම | 6,107,497 | 2013.03.13 | 2013.12.31 | - | 40 | මාර්ග ව්‍යාපෘතියක ට ප්‍රාකාර |

බැම්මේ
කොටසක්
ඇතුළත්වන
බැවින්
ව්‍යාපෘතිය
නැවැත්වීම.

**2.8** **කාර්යසාධනය**

----------------

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්.**

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) දැලිවල චෛත්‍ය සංරක්ෂණය**

-------------------------------

දැලිවල චෛත්‍ය සංරක්ෂණය කිරීමේ කටයුතු 1998 වර්ෂයේ සිට වැඩ ආරම්භ කර තිබුණි. එම කටයුතු 2014 මාර්තු වන විටත් නිම කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් කළ පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) චෛත්‍යයේ පේසාව සම්පූර්ණයෙන් විනාශවීම නිසා දාගැබට සිදුවිය හැකි හානි වලක්වා ගැනීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් තනි පේසාවක් පරිදි සංරක්ෂණය කිරීමට පියවර ගෙන තිබුණි. වැඩ ආරම්භ කර වසර 15 කට වැඩි කාලයක් ගතවී තිබුණත් එහි සංරක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.

(ii) චෛත්‍ය සම්පූර්ණයෙන් ආරක්ෂා කිරීමට පේසාව අඩි 18 ක් ගොඩනැගිය යුතු වුවත්, 2014 මාර්තු මාසය වන විට අඩි 13 ක් පමණ උසට හා පළලින් අඩි 10-14 ප්‍රමාණයට පේසාව ඉදිකර තිබුණි. චෛත්‍ය ගර්භයේද ගල් ගැලවී කඩා වැටී විනාශවීමට ඉඩ ඇති හෙයින් එයද කඩිනමින් සංරක්ෂණය කිරීමේ අවදානමක්ද නිරීක්ෂණය විය. 2013 වර්ෂයේ පේසාව ඉතිරි කොටස මත අඩි 5 ක ප්‍රමාණය ගොඩනැගීමටත් ගර්භය සංරක්ෂණය කිරීමටත් රුපියල් මිලියන 50 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබූ අතර එහි පේසාව අඩි 5 සම්පූර්ණ කිරීමට රු.9,929,500 ක් ඇස්තමේන්තු කර තිබුණි. මෙම ඇස්තමේන්තුවට අදාල ව්‍යාපෘති යෝජනාව අනුව එය 2013 අගොස්තු මාසයේ ආරම්භ කර 2013 සැප්තැම්බර් මාසයේදී නිම කිරීමට අපේක්ෂා කර තිබුණත්, 2014 මාර්තු මාසය අවසන් වන විටත් වැඩ ආරම්භ කර නොතිබුණි.

**(ආ) මධ්‍යම පළාතේ විහාරයේ වාස්තු විද්‍යා සංරක්ෂණ ව්‍යාපෘතිය**

--------------------------------------------------------------

මධ්‍යම පළාතේ දන්තුරේ විහාරයේ වාස්තු විද්‍යා සංරක්ෂණ කටයුතු වෙනුවෙන් රු.923,750 ක් ඇස්තමේන්තු කර එය 2013 වර්ෂයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මටද ඇතුළත් කර තිබුණි. එම ව්‍යාපෘතිය 2013 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

**2.9** **බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලපුම් කළ යුතු ශේෂ**

දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව හඳුනා නොගත් හර ශේෂ එකතුව රු.1,118,474 ක් වී තිබුණි. එම ශේෂය තුළ වර්ෂ 03 කට අධික කාලයක් මුළුල්ලේ පැවැත එන හඳුනා නොගත් හර ශේෂ එකතුව රු.1,009,990 ක් වුවත්, එම ශේෂ 2014 අගෝස්තු මාසය වන විටත් නිරවුල් කර නොතිබුණි.

**2.10** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

දෙපාර්තමේන්තුවේ විදුලි පද්ධතියේ නඩත්තු වියදම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ විදුලි පද්ධතිය නඩත්තු කටයුතු සඳහා විදුලිබල මණ්ඩලයට 2011, 2012 හා 2013 වර්ෂ සඳහා එකතුව රු.2,889,947 ක් ගෙවා තිබුණි. එම වියදම තුළ විදුලි නඩත්තු වශයෙන් රු.2,642,865 ක් ගෙවා තිබුණත්, ඒ සඳහා ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ) විදුලි බල මණ්ඩලය විසින් සිදුකරන නඩත්තු කටයුතු පිළිබඳ වාර්තා හෝ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එම වියදම් සතුටුදායක ලෙස සන්නික්ෂණය කිරීමට නොහැකි විය.

**2.11** **පාඩු හා හානි**

ජාතික කෞතුකාගාරයට අයත් වෑන් රථයක් ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම පරිදි 2013 ජූලි 15 සිට මාසයක කාලයක් සඳහා අම්පාර පුරා විද්‍යා ස්ථාන ලේඛනගත කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත තාවකාලික නිදහස් කර තිබුණි. එහි හදිසි අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු.585,822 ක පිරිවැයක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට දැරීමට සිදු වී තිබුණි.

**2.12** **කළමනාකරණ දුර්වලතා**

දෙපාර්තමේන්තුව විසින් කරන ලද සමහර ගනුදෙනු සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ)** **පුරාවස්තු තෑගි අරමුදල**

1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනතේ 46(1) වගන්තිය යටතේ පුරාවස්තු තෑගි අරමුදල පිහිටුවා

තිබුණි. නීති විරෝධී ලෙස ප්‍රයෝජනයට ගත් පුරාවස්තු ආපසු ලබා ගැනීමට, පුරාවස්තු ආරක්ෂා කිරීමට හෝ දායකත්වය දෙන පුද්ගලයන්ට හා නිලධාරීන්ට ඔවුන්ගේ කාර්‍යක්ෂමතාව හා ඵලදායීතාවය වැඩිකිරීමේ අරමුණින් මෙම අරමුදල ස්ථාපිත කර තිබුණි. 2007 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා කාලය සඳහා දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි උසාවි විසින් නියම කරන ලද එකතු වටිනාකම රු.44,619,540 ක් වූ දඩ මුදල් දෙපාර්තමේන්තුව වෙත එවා තිබුණි. එම මුදල් 2013 සැප්තැම්බර් 15 දින වන විටත් අරමුදලට බැර නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** 2012 ජූනි 22 දිනැති ගැසට් නිවේදනය අනුව අරමුදල ස්ථාපනය කිරීමේ අරමුණු ඉටු කිරීම වෙනුවෙන් දායකවන නිලධාරීන් දිරිගැන්වෙන ආකාරයට අරමුදලේ මුදල් උපයෝජනය නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබීම නිසා අරමුදලේ අරමුණු ඉටු වී නොතිබුණි.

**(ii)** 2009 හා 2010 වර්ෂවල ගලෙන් බිඳුනු වැව පොලිස් වසම තුළ පුරාවස්තු සෙවීමට කැණීම් කිරීම හා පුරාවස්තු වටිනාකමක් ඇති සංසර්භවලට හානි කිරීමේ චෝදනා මත කහටගස්දිගිලිය අධිකරණයේ පවරා තිබුණු නඩු 3 කින් වරදකරුවන්ට රු.12,300,000 ක දඩ පනවා තිබුණි. එම දඩවලින් පුරාවස්තු තෑගි අරමුදලට ලැබිය යුතු රු.4,700,000 ක් අරමුදල වෙත ලබාගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**(iii)** පුරාවස්තු තෑගි අරමුදලේ ප්‍රතිලාභ දෙපාර්තමේන්තුවේ සියළු කාර්ය මණ්ඩලය වෙත බෙදීයන ආකාරයට පුරාවස්තු තෑගි අරමුදල් බෙදීමේ විධිවිධාන සකසන ලෙස දෙපාර්තමේන්තුවට සම්බන්ධ පාර්ශවයන් 8 ක ගෙන් පමණ විවිධ යෝජනා හා ඉල්ලීම් ලිඛිතව ඉදිරිපත් කර තිබුණි. නමුත් දෙපාර්තමේන්තුව ඒ සම්බන්ධව ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

**(ආ) ගල්වලවල් සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලියේ අඩුපාඩු**

---

මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(i)** බලපත්‍ර ලබාදීම සඳහා සාමාන්‍ය ලිපියක් භාවිතා කරන අතර එක් එක් දිස්ත්‍රික්ක හෝ පළාත් අනුව අංක මුද්‍රණය කරන ලද ආරක්ෂිත කඩදාසි ඒ සඳහා භාවිතා කර නොතිබුණි.

**(ii)** නිකුත් කර තිබුණු බලපත්‍ර සම්බන්ධයෙන් දිස්ත්‍රික්කයේ හෝ පළාත් මට්ටමින් විස්තර සහිත ලේඛනයක් ප්‍රධාන කාර්යාලයේ පවත්වා නොතිබුණි.

**(ඇ) පුරාවස්තු විනාශය - සීනක්කුගල**

**----------------------------------**

පුරාවිද්‍යාත්මක ලක්ෂණ පිහිටි ප්‍රදේශයෙන් මීටර් 50 ක සීමාව තුළ ගල් කැඩීම, බෝර දැමීම සිදු නොකිරීම හා හඳුනාගෙන තිබුණු පුරාවස්තුවලට හානි නොකිරීම යන කොන්දේසි මත හම්බන්තොට සීනක්කුගල ගල්තලාවේ ගල් කැඩීම සඳහා 2006 දෙසැම්බර් 01 දින බලපත්‍රයක් නිකුත් කර තිබුණි. එම බලපත්‍රලාභියා විසින් එහි කොන්දේසි උල්ලංඝනය කිරීම නිසා 2008 ඔක්තොබර් 23 දින බලපත්‍රය අවලංගු කර තිබුණි. 2011 පෙබරවාරි 15 දින කොන්දේසි සහිතව එම තැනැත්තාටම එම ගල් කොරියේම ගල් කැඩීම සඳහා බලපත්‍රයක් ලබාදී තිබුණි. 2013 නොවැම්බර් 01 දින පුරාවිද්‍යා දෙපාර්තමේන්තු නිලධාරින් එම ස්ථානයේ ක්ෂේත්‍ර පරීක්ෂාව සිදුකරන අවස්ථාව වන විට එම බලපත්‍රලාභියාගේ ක්‍රියාකාරීත්වය හේතුවෙන් කලින් හඳුනාගෙන තිබූ පුරාවස්තු විනාශ කර තිබුණි. පුරාවස්තු විනාශ කිරීමට සම්බන්ධව එම බලපත්‍රධාරියා අත්අඩංගුවට ගෙන මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු වරද පිළිගැනීම නිසා රු.100,000 ක දඩයක් නියමකර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(i)** පුරාවිද්‍යා නිර්නායකයන්ට පටහැනිව ගල්වලවල් පවත්වාගෙන ගිය තැනැත්තන් අසාදු ලේඛනගත කිරීමේ වැඩපිළිවෙලක් නොතිබුණි.

**(ii)** ගල්වලවල් පවත්වාගෙන යාම සඳහා පනවන කොන්දේසි උල්ලංඝනය කිරීම නිසා බලපත්‍රය 2008 වර්ෂයේදී අවලංගු කර තිබුණත්, 2011 වර්ෂයේ එම ස්ථානයේම ගල්වලක් පවත්වා ගෙනයාමට එම තැනැත්තාටම බලපත්‍ර ලබා දීමෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තු නිලධාරීන් වගකීම් රහිතව ක්‍රියාකර තිබුණි.

**(iii)** පුරාවිද්‍යාත්මක ස්ථානයක් බවට හඳුනාගෙන හා ඊට ආසන්න ස්ථානයක ගල් කොරියක් පවත්වාගෙන යාමට අවසර ලබාදී තිබියදී 2011 පෙබරවාරි 15 දින සිට 2013 ඔක්තෝබර් මාසය අවසාන වන විටත් වසර 2 1/2 කට වැඩි කාලයක් තුළ පුරාවිද්‍යාත්මක ස්මාරක පිළිබඳ දෙපාර්තමේන්තු නිලධාරින්ගේ අවධානය යොමු වී නොතිබුණි.

**(ඈ) පුරාවස්තු විනාශය - පළුදෙණිය**

**----------------------------------**

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 229 සිරිපුර ග්‍රාමසේවා වසමේ පළුදෙණිය ගමේ අක්කර 50 ක පමණ භූමි ප්‍රමාණය තුළ 2004 වර්ෂයේ සිදුකළ මූලික ගවේෂණයට අදාල වාර්තාව අනුව හඳුනාගත් ස්මාරක 08 ක් හා සංස්කෘතික අවශේෂ රැසක් හමු වී තිබුණි. එම වාර්තාවේ නිගමන හා යෝජනා යටතේ ඒ වන විටත් කරගෙන යන ගල් කැඩීම් නතර කළ යුතු බවත් පුරාවස්තු විනාශය පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග ගතයුතු

බවත් එහි දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(i)** 2013 ඔක්තෝබර් 10 දින පුරාවිද්‍යා සහකාර අධ්‍යක්ෂ (උතුරුමැද) ඇතුළු කාර්ය මණ්ඩලය කළුගල් කැඩීමේ කටයුතු සිදුකරන භූමියෙහි පුරාවස්තු හානිය පිළිබඳ පරීක්ෂාවන් කර තිබුණි. එම පරීක්ෂාවේදී පැරණි ගඩොල් අවශේෂ නිරීක්ෂණය වී තිබූ අතර මතුපිට වෙනත් ස්මාරකයන්හි අවශේෂ දක්නට නොතිබුණු බව විගණනයට වාර්තා කර තිබුණි. මේ අනුව 2004 වර්ෂයේ මූලික ගවේෂණ වාර්තාවේ නිගමන හා යෝජනා ක්‍රියාත්මක කර නොතිබූ අතර හඳුනාගත් ස්මාරක 08 ක් හා සංස්කෘතික අවශේෂ විනාශකර තිබුණි.

**(ii)** පළුදෙණිය මූලික ගවේෂණ වාර්තාවේ ඇතුළත් මෙම භූමිය රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම, විධිමත් ගවේෂණයක් සිදුකර ස්මාරක ලේඛනගත කිරීම යන කටයුතු 2013 වර්ෂය අවසන් වන විටත් සිදු කර නොතිබූ අතර එසේ නොකිරීමට සාධාරණ හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම පුරාවස්තු හානියට වගකිවයුත්තන් හඳුනාගෙන නීතිය ක්‍රියාත්මක කිරීමටද කටයුතු කර නොතිබුණි.

**(ඉ) අලකේෂ්වර කලාප කාර්යාලය හා ගබඩාව ඉදිකිරීම.**

කෝට්ටේ කලාප අංක 03 පුරාවිද්‍යා කාර්යාලය හා ගබඩාව ඉදිකිරීමේ ව්‍යාපෘතිය කෝට්ටේ අලකේෂ්වර පුරාවිද්‍යා භූමියේදී 2013 අගෝස්තු 01 දින ආරම්භ කර 2013 ඔක්තෝබර් 31 දින වන විට අවසන් කළ යුතුව තිබුණි. මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම රු.1,463,968 ක් විය. ව්‍යාපෘතියේ ගොඩනැගිලි සැලැසුම අනුමැතිය සඳහා නගර සභාවට ඉදිරිපත් කර තිබුණද, ඉඩමේ පිඹුරුපත ඉදිරිපත් නොකිරීම නිසා 2013 දෙසැම්බර් 31 දින වන විට ගොඩනැගිලි සැලැසුම් සඳහා අනුමැතිය ලබා දී නොතිබූ අතර ඉදිකිරීම් කටයුතු ද ආරම්භකර නොතිබුණි.

**(ඊ) මධ්‍යම පළාතේ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් චෝදනා ලත් නිලධාරියෙක් සාමාන්‍ය පරිදි විශ්‍රාම ගැන්වීම.**

මධ්‍යම පළාතේ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් 2012 වර්ෂයේදී අනාවරණය වී තිබුණු අක්‍රමිකතා පිළිබඳව අමාත්‍යාංශ මට්ටමින් මූලික විමර්ශනයට ලක් වූ ප්‍රාදේශීය පුරාවිද්‍යා අධ්‍යක්ෂවරයා (මධ්‍යම) වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 12 වන වගන්තිය යටතේ විශ්‍රාම ගන්වා තිබුණි. විශ්‍රාම යාමට ඉල්ලුම් කළ අවස්ථාව වන විට මූලික විමර්ශනයට අදාල උසාවි ක්‍රියාමාර්ග අවසන්ව නොතිබීමත්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පරීක්ෂණ අවසන් නොවීමත්,

අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ ලබා නොගැනීමත් හා අධිකරණයේදී අමාත්‍යාංශ ලේකම් එකඟ වී තිබූ පරිදි මූලික විමර්ශනය 2014 අගෝස්තු මාසය වන විටත් අවසන් කර නොතිබුණත්, එම නිලධාරියා විශ්‍රාම ගන්වා තිබුණි.

**(උ) අලෙවි නොවූ පොත්**

ප්‍රධාන කාර්යාලයේ ගබඩාව තුළ 2002, 2003, 2005 හා 2006 වර්ෂවලට අදාල පොත් මෙන්ම වර්ෂයක් සොයාගත නොහැකි පැරණි පොත් විශාල ප්‍රමාණයක් ද ඇතුළුව පොත් 47,592 ක් නිෂ්කාර්යව පැවැතුණි. එසේම ප්‍රධාන කාර්යාලයේ අලෙවි අංශය තුළද පැරණි පොත් 2,166 ක ප්‍රමාණයක් පැවැතුණි.

**(ඌ) පාලන වාර්තා ඇතුළු පොත් මුද්‍රණය**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ විසින් පාලන වාර්තාවට තොරතුරු ලබා නොදීම නිසා 2009 වර්ෂයෙන් පසු දෙපාර්තමේන්තුව විසින් පාලන වාර්තා මුද්‍රණය කර නොතිබුණි.

**(ii)** දෙපාර්තමේන්තුවේ ගබඩාව තුළ 1970 වර්ෂයේ සිට 1998 වර්ෂය දක්වා කාලයට අයත් පාලන වාර්තා 12,196 ක් පැවැතුණි. මෙසේ අධික පොත් සංඛ්‍යාවක් මුද්‍රණය කිරීමට හේතු විගණනයට අනාවරණය නොවූ අතර ඒ වෙනුවෙන් වැය කර තිබුණු මුදල් ඵලරහිත වී තිබුණි.

**(iii)** **Monastic Sri Lanka** පොත හිටපු පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් විසින් ලියා තිබුණි. දෙපාර්තමේන්තුව විසින් මෙම පොත මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් මුද්‍රණය කර ගැනීම සඳහා පොතකට රු.1,512 බැගින් පොත් 1010 ක් වෙනුවෙන් රු.1,527,120 ක් වැයකර තිබුණි. මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් එම පොත්වලින් 997 ක් දෙපාර්තමේන්තු පොත් අලෙවිසැලට සෘජුවම සපයා තිබුණු අතර එම පොත් දෙපාර්තමේන්තු ගබඩාවේ ලේඛනවල ඇතුළත් කර නොතිබුණි. එමෙන්ම පිළිගත් ක්‍රියාපටිපාටිවලින් තොරව සෘජුව අලෙවි අංශයට පොත් ලබා ගැනීමට හේතු වූ කරුණු විගණනයට අනාවරණය වී නොතිබුණි.

**(එ) පුරාවස්තු හානි සිද්ධීන්**

පුරාවස්තු පිහිටි පුරාවිද්‍යා ස්මාරක ඇති ස්ථානවල පුරාවස්තු සොරකම, අනවසර කැණීම් හා පුරාවස්තු විනාශය ඇතුළු පුරාවස්තු පනතට ගැනෙන වැරදි වැලැක්වීම සඳහා 2008 මාර්තු 04 දින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව තුළ විශේෂ පොලිස් ඒකකයක් පිහිටුවා තිබුණි. 2012 ජුනි 15 දින එම ඒකකය පොලිස් කොට්ඨාශයක් වශයෙන් නම් කර පුරාවිද්‍යා

ආරක්ෂණ පොලිස් කොට්ඨාශය ස්ථාපිත කර තිබුණි. 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා පුරාවස්තු හානිවලට අදාල පොලිස් වාර්තාවල ඇතුළත් තොරතුරු සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** පුරාවස්තු හානි සිද්ධීන්වල එකතුව 2012 වර්ෂයට වඩා 2013 වර්ෂයේදී අඩු වී තිබුණි. පුරාවස්තු සෙවීම සඳහා කැණීම් කිරීම සම්බන්ධයෙන් වූ සිද්ධීන් ගණන 2012 වර්ෂයේ දී 216 ප්‍රමාණයට සමාන සිද්ධි ප්‍රමාණයක් 2013 වර්ෂයේදීද වාර්තා වී තිබුණි.

**(ii)** පොලිස් කොට්ඨාශය වෙත වාර්තා වී තිබුණු පුරාවස්තු හානි සිද්ධීන් අතරින් විමර්ශනය අවසන් නොවූ සිද්ධීන් ප්‍රමාණය 2012 වර්ෂයේදී 104 ක්ව පැවති අතර 2013 වර්ෂයේදී එය 168 ක් හෙවත් සියයට 61 කින් පමණ වර්ධනය වී තිබුණි.

**(iii)** පුරාවස්තු පනතට යටතට ගැනෙන වැරදි වාර්තාවීම පිළිබඳව පළාත් අනුව නිරීක්ෂණය කිරීමේදී පළාත් 07 ක සිද්ධීන් ප්‍රමාණය අඩු වී තිබූ අතර උතුර හා උතුරු මැද පළාත් දෙකෙහි වැඩි වී තිබුණි. වැඩිම පුරාවිද්‍යා ස්මාරක ප්‍රමාණයක් ඇති හා වැඩිම සිද්ධීන් ප්‍රමාණයක් වාර්තා වන උතුරු මැද පළාත තුළ 2012 වර්ෂයේදී සිද්ධින් 82 ක් වාර්තා වී තිබූ අතර 2013 වර්ෂයේදී සිද්ධීන් ගණන 116 දක්වා, එනම් සියයට 41 කින් වැඩි වී තිබුණි.

**(ඒ)** **චංචල පුරාවස්තු ආරක්ෂා කිරීම.**

---

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ රසායනාගාරය තුළ හා කාර්යාලයේ ආරක්ෂිත සේප්පු තුළ තැන්පත් කර තිබුණු චංචල පුරාවස්තු පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) රසායනාගාරය මගින් පුරාවස්තු හඳුනා ගැනීමේ ක්‍රමවේදයන් ලෙස CCL (Colombo Conservation Laboratory) අංක ලබා දී වීදුරු කබඩ් තුළ ගබඩා කර තිබුණි. 2013 සැප්තැම්බර් 03 දින වන විට භාණ්ඩ 677 ක් සඳහා CCL අංක ලබා දීමට අමතරව ලියාපදිංචි අංකය හා දිනය, කබඩ් අංකය, පුරාවස්තු නම පුරාවස්තුව පිළිබඳ විස්තර සී.ආර් පොතක සටහන් කර තිබුණි. ඇතැම් පුරාවස්තු ලියාපදිංචි කළ දින හෝ ලබාගත් ස්ථාන පිළිබඳ හෝ පුරාවිද්‍යා වැදගත්කම පිළිබඳ අදාල සාක්ෂි නොමැති බව අනාවරණය විය. දශක කිහිපයකදී සොයාගන්නා ලද පුරාවස්තු පහසුවෙන් හඳුනා ගැනීමට හැකි ක්‍රමවත් වැඩපිළිවෙලක් අනුගමනය කර නොතිබුණි.

(ii) රසායන අංශයේ නිලධාරීන් විසින් පුරාවස්තු සඳහා 2010 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් 31 දින වන විට නව අංක ලබා දී සූචිගත කර තිබුණද, එම තොරතුරු පරිගණක ගතකර නොතිබුණි.

(iii) පුරාවස්තු ලේඛනගත කිරීමේදී පැරණි කාසි විශාල ප්‍රමාණයක් එක් මල්ලකට එක් අංකය බැගින් ලබා දී තිබූ අතර එහි අඩංගු කාසි ප්‍රමාණය හෝ මූල්‍යමය වටිනාකම පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

(iv) වසර ගණනාවක සිට පුරාවස්තු පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර නොතිබුණු අතර පුරාවස්තු ගබඩා කර තිබුණු කබඩ් අනුව පුරාවස්තු ලේඛනගත කිරීම ආරම්භ කර තිබුණි. ඒ අනුව දැනට පවතින පුරාවස්තු පමණක් ලේඛනගත කර තිබුණත්, හානි වී ඇති පුරාවස්තු ලේඛනගත කිරීම සිදු කර නොතිබුණි.

**(ඔ) ප්‍රධාන කාර්යාලයේ රසායනාගාරය තුළ හා සේප්පුවල තැන්පත් කර ඇති පුරාවස්තු**

-----------------------------------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පුරාවස්තු ලී කබඩ්වල වසර 20 සිට වසර 30 ක කාල පරාසයක් තුළ තැන්පත් කර තිබුණි. එම කබඩ්වල ඉඩ ප්‍රමාණවත් නොවීම, අවශ්‍ය ආලෝකය හා වාතය නොලැබීම යන කරුණු කෙරෙහි අවධානය යොමු වී නොතිබුණු අතර පැරණි කාසි එකම කවරයක බහා ලාච්චුවේ පැවතීම නිසා එකිනෙක ඇලී දූර්වර්ණ වී පැවතුණි. එම පුරා වස්තු වසර ගණනාවකට පෙර සංරක්ෂණය කර තිබූ හෙයින් ඒවා නැවත සංරක්ෂණය කළ යුතුව පැවතුණි.

(ii) සංරක්ෂණය කිරීමෙන් පසු පුරාවස්තු කෞතුකාගාර වෙත නිකුත් කිරීම සිදුකළ යුතු නමුත් රසායන සංරක්ෂණ අංශය සතුව විධිමත් ලේඛනගත කිරීමකින් තොරව දීර්ඝ කාලයක සිට පුරාවස්තු විශාල ප්‍රමාණයක් පැවැතිණි.

(iii) පුරාවිද්‍යා ප්‍රධාන කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ ස්ථාන 03 ක ආරක්ෂිත සේප්පු 03 ක පුරාවිද්‍යාත්මක හා මූල්‍යමය වශයෙන් වටිනා පුරාවස්තු රැසක් තැන්පත් කර තිබුණු අතර සියළුම පුරාවස්තුවල භාරකාරිත්වය පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු විය. නමුත් පුරාවස්තු පිළිබඳ වගකීම මනා දැනුමක් ඇති දෙපාර්තමේන්තු නිලධාරීන් වෙත පැවරීමකින් තොරව 2013 අගොස්තු මාසය වන විටත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී වෙත එම පුරාවස්තුවල වගකීම පවරා තිබුණි.

(iv) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිල කාමරය, ගණකාධිකාරීගේ නිල කාමරය හා ශ්‍රවනාගාරයේ යන ස්ථාන 03 හි ආරක්ෂිත සේප්පුවල ඉහත සඳහන් වටිනා පුරාවස්තු තැන්පත් කර තිබුණත්, වෙනත් පුද්ගලයන්ට මෙම සේප්පු වෙත ළඟාවිමට නොහැකිවන පරිදි ආරක්ෂිත තත්ත්වයක් ඇති කර නොතිබුණි.

(v) මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් කැණීම් කිරීමේදී හමු වී තිබුණු පුරාවස්තු එම අරමුදල භාරයේ පවත්වාගෙන යනු ලබයි. එම භාණ්ඩ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට හා භාරයට ගැනීමට මෙන්ම ලේඛනගත කිරීමට ද කටයුතු කර නොතිබුණි.

**(ඕ) නිශ්චල දේපළ ප්‍රකාශයට පත් කිරීම.**

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක 250,000 ක් පමණ තිබූ බව හඳුනාගෙන තිබුණි. ඉන් 2013 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රකාශයට පත්කර තිබුණු ස්මාරක සංඛ්‍යාව 2,139 ක් වී තිබුණු අතර ප්‍රකාශයට පත්කර තිබුණු පුරාවිද්‍යා රක්ෂිත (තහනම් ඉඩම්) සංඛ්‍යාව 116 ක් වී තිබුණි. උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ හඳුනාගත් ස්මාරක 527 ක් අතුරින් 146 ක්ද, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හඳුනාගත් ස්මාරක 149 ක් අතුරින් 12 ක්ද, ප්‍රකාශයට පත්කර තිබුණි. මෙම තත්ත්වය යටතේ රටපුරා විසිරී ඇති 2013 දෙසැම්බර් 31 දින වනවිට හඳුනා ගෙන නොතිබුණු පුරාවිද්‍යා ස්මාරක හඳුනාගැනීමට ගවේෂණය කර තොරතුරු රැස්කිරීමටත්, සීමා ලකුණු කිරීම මෙන්ම එම ස්මාරක ප්‍රකාශයට පත්කිරීමට කාර්යක්ෂම ලෙස දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**(ක) චංචල පුරාවස්තු ලේඛනගත කිරීම.**

ශ්‍රී ලංකාවේ පවතින චංචල පුරාවස්තු ඡායාරූපගත කර විධිමත් ආකාරයට ලේඛනගත කර දත්ත ගබඩාවක් පවත්වාගෙන යාමේ ව්‍යාපෘතිය 2010 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. ඒ යටතේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කෞතුකාගාර දෙපාර්තමේන්තුව හා මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් ප්‍රධාන කාර්යාල හා ප්‍රාදේශීය කෞතුකාගාර සතු පුරාවස්තු මෙන්ම ආගමික ස්ථාන, පුද්ගලික ස්ථාන හා පුද්ගලයන් සතු පුරාවස්තුද විශාල ප්‍රමාණයක් ලේඛනගත කිරීමට යෝජිතව පැවැතුණි. නමුත් ව්‍යාපෘතිය සඳහා යොදන ලද භෞතික හා මානව සම්පත් ප්‍රමාණවත් නොවීම මත 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලය තුළ ප්‍රධාන කාර්යාලයේ රසායනාගාරයේ තිබුණු පුරාවස්තු 677 ක් පමණක් ලේඛනගත කර තිබුණි.

**(ග) නීලගිරි කැණීම්වලදී හමු වූ පුරාවස්තු පිළිබඳ පරීක්ෂාව**

දාගැබේ කොටසක් කඩා වැටී විශාල ගස්වලින් වැසී තිබුණු ප්‍රදේශයේ කැණීම් කටයුතු 2011 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර රන් කරඬු, කාසි, පළිඟු හා වටිනා ගල් වර්ග විශාල ප්‍රමාණයක් හමු වී තිබුණු බවට සාක්ෂි තිබුණි. 2013 ඔක්තෝබර් මාසය වන විට නීලගිරි සෑය කැණීම් භූමියෙන් සියයට 95 ක කැණීම් අවසන් කර තිබුණු අතර මෑත ඉතිහාසයේ වැඩිම පුරාවස්තු ප්‍රමාණයක් හමු වූ පුරාවිද්‍යා භූමිය ලෙස ද එය වාර්තා වී තිබුණි. කැණීම් කටයුතු සිදු කිරීමේදී පුරාවිද්‍යා උරුමයන්ට සිදු විය හැකි හානි අවම වන පරිදි කටයුතු කළ යුතු බවට පුරාවිද්‍යා මාර්ගෝපදේශ අත්පොතෙහි සඳහන් කර තිබුණද,

නීලගිරි සෑයේ කැණීම් කිරීමේදී පහත සඳහන් පරදි එම නීති,රීති හා විධිවිධානවලට පටහැනිව ක්‍රියාකර තිබුණු අවස්ථා කිහිපයක් නිරීක්ෂණය විය.

(i) ස්ථාන භාර නිලධාරියෙකු නොමැතිව සෙසු නිලධාරීන්ගේ අභිමතය පරිදි කැණීම් සිදු කර තිබුණි.

(ii) වැඩබිමේ සිටි ජ්‍යෙෂ්ඨ නිලධාරින් සෙසු නිලධාරින්ට අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබා නොදී කැණීම් භූමිය තුළම වෙනත් කාර්යයන් වල නිරත වී තිබුණි.

(iii) පුහුණු වැඩමුළුවේදී ලබාදුන් උපදෙස් (උපදෙස් මාලාවේ 6.3 ඡේදය) නොතකා කැණීම්වලදී හමුවූ පුරාවස්තු අදාල ස්ථානවලින් ඉවත් කිරීම හා මැණික් වැනි වර්ණ ගල් සේදීමට ලක් කිරීම වැනි කටයුතු අවිධිමත්ව හා පිළිගත් ක්‍රමවේදයට පටහැනිව සිදු කර තිබුණි.

(iv) හමු වූ පුරාවස්තු බහාලූ ඉටිකවර සීල් නොකර දින කීපයක් තබාගෙන තිබුණි.

(v) හමු වූ පුරාවස්තු ලේඛනගත කර නොතිබුණි.

(vi) හමු වූ පුරාවස්තු වලින් කොටසක් ඡායාරූපගත කර නොතිබුණි.

(vii) 2013 ඔක්තොබර් 19 දින හමු වූ පුරාවස්තු පිළිබඳව 2013 ඔක්තෝබර් 24 දින වන විටත් පුරවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ වෙනත් වගකිව යුතු නිලධාරියෙකු දැනුවත් කර නොතිබුණි.

(viii) 2013 ඔක්තෝබර් 23 දින නැගෙනහිර පළාත භාර පුරාවිද්‍යා සහකාර අධ්‍යක්ෂ (වැඩබලන) නීලගිරි සෑයේ කැණීම් භූමියට පැමිණ අදාල පුරාවස්තු තැන්පත් කර තිබූ යකඩ පෙට්ටියේ ඉබි යතුරු කඩා පරීක්ෂා කිරීමට උත්සාහ ගැනීමේදී පුරාවස්තුවලට වියහැකි හානි පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි.

(ix) කැණීම්වලදී හමු වූ මූල්‍යමය හා ඓතිහාසික වටිනාකමක් ඇති කරඬු ඇතුළු අනෙකුත් පුරාවස්තු සහකාර අධ්‍යක්ෂ විසින් සිය භාරයට ගෙන පොලිස් ආරක්ෂාව හෝ ලබා නොගෙන 2013 ඔක්තෝබර් 23 දින රාත්‍රියේ විහාරස්ථානයේ නැවතී පසුදා පළාත් කාර්යාලය දක්වා ගමන් කර තිබුණි. එසේ කිරීම සඳහා ඔහුට විධිමත් අවසරයක් නොතිබුණ අතර ඔවුන්ගේ අභිමතය පරිදි කටයුතු කර තිබුණි.

(x) නීලගිරි කැණීම්වලදී පුරාවස්තු විශාල ප්‍රමාණයක් හමු වී තිබුණද, කැණීම් භූමියට අත්‍යවශ්‍ය උපකරණ වන පුරාවස්තු තැන්පත් කිරීමේ ආරක්ෂක පෙට්ටි, කැමරා, පරිගණක හා මිනුම් උපකරණ ලබාදීමට කටයුතු නොකිරීම නිසා නිලධාරීන්ට තමන්ගේ පෞද්ගලික පරිගණක හා කැමරා භාවිතා කිරීමට සිදුව තිබුණි.

(xi) 2013 ඔක්තෝබර් මාසයේ දී හමු වූ පුරාවස්තු පිළිබඳ දෛනික වාර්තා ඇතුළත් කර ඡායාරූප ගැනීම හා ලේඛනගත කිරීම සිදුකර ඒවා විනිවිද භාවයෙන් යුතුව මුද්‍රා තබා අප්‍රමාදව හා ආරක්ෂිතව රැගෙන ඒම සඳහා විධිමත් වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුවේ කළමනාකාරිත්වය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. 2013 ඔක්තෝබර් 19 දින සිට 24

දින දක්වා කැණීම් භූමියේ සිටි නිලධාරීන් හා ලද තොරතුරු මත පරීක්ෂා කිරීමට ගිය නිලධාරීන් ක්‍රියාකර තිබූ අවිධිමත් ආකාරය අනුව මැණික් යැයි සිතිය හැකි වර්ණ ගල්ද ඇතුළුව හමු වූ පුරාවස්තු අවභාවිත නොවුනා යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

**(ඡ) හමුවන පුරාවස්තු පිළිබඳ ඉදිරි වැඩසටහනක් නොතිබීම**

---

නීලගිරි සෑයෙන් මෙතෙක් හමු වී ඇති කරඬු 15 ක පමණ ප්‍රමාණය තුළ ධාතූන් වහන්සේලා තැන්පත් කර තිබූ බවට විශ්වාස කෙරෙන අතර ඒවා ධාතු ප්‍රදර්ශන සඳහා ලබාදුන් අවස්ථාද තිබුණි. මේ පිළිබඳව පුරාවිද්‍යා ක්ෂේත්‍රයෙහි විශේෂඥයින්ගේ සහයෝගය ඇතිව අධ්‍යනයක් සිදුකර වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම එම ඓතිහාසික කරඬු තැන්පත් කිරීමට අදාලව ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව ඉදිරි සැලැසුම් සකස් කිරීම කෙරෙහි 2013 දෙසැම්බර් 31 දින වන විටත් අවධානය යොමු කර නොතිබුණු අතර ඓතිහාසික රන් කරඬු ඇතුළු පුරාවස්තු දෙපාර්තමේන්තුවේ සේප්පුවල හා ගබඩාවල ආගමික වටිනාකමකින් තොරව වසර 1 සිට වසර 3 දක්වා කාලයක සිට තැන්පත් කර තිබුණි.

**(ට) තොළුවිල පුරාවිද්‍යා රක්ෂිතයේ පෙත්මග තහවුරු කිරීම**

---

අනුරාධපුර තොළුවිල පුරාවිද්‍යා රක්ෂිතය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කාර්මික නිලධාරි වාර්තාව අනුව තොළුවිල පුරාවිද්‍යා රක්ෂිතය අනුරාධපුර ත්‍රිකුණාමලය මාර්ගයේ අනුරාධපුර නගරයේ සිට මීටර් 500 පමණ දුරින් පිහිටා ඇති අතර එය අක්කර 38 කින් යුක්තය. මේ රක්ෂිතයේ අනුරාධපුර නගරයට ආසන්න බැවින් විවිධ පුද්ගලයන් එහි දකුණු හා නැගෙනහිර දිසාවේ ඉඩම් කොටස් අනවසරයෙන් අත්පත් කරගෙන පදිංචි වී තිබුණි.

(ii) රක්ෂිතය පුරාම පුරාවිද්‍යා සාධක රැසක් විසිරී පවතින අතර රක්ෂිතය මැදින් ගම්වැසියන් පා ගමනින් හා වාහන මගින් ගමන් කිරීම නිසා පුරාවස්තුවල පැවැත්මට හා ආරක්ෂාවට තර්ජනයක් වී තිබුණි.

(iii) පුරාවිද්‍යා රක්ෂිතය අනාරක්ෂිත වී පැවතියද, මායිම් කණු යොදා ආරක්ෂක වැටවල් ඉදි කර නොතිබුණි. එසේම රක්ෂිතයේ සංවර්ධනය අරමුණු කරගෙන කාර්මික නිලධාරි වාර්තාවේ පහත සඳහන් යෝජනා ඇතුළත් කර තිබුණි.

- පුරාවිද්‍යා රක්ෂිතයේ ආරක්ෂාව සඳහා මායිම්වලට ස්ථිර ක්‍රමවේදයක් භාවිතා කරමින් මායිම් සකස් කර ශක්තිමත් වැටක් ඉදි කිරීම.
- මායිම ආසන්නයේ ඇති පුරාවිද්‍යාත්මක ස්මාරක සියල්ල සංරක්ෂණය කිරීම.

- අසල ගම්මානයට යාම සඳහා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් වෙන්කර දුන් මාර්ගයේ මායිම ආසන්නයේ ඇති පුරාවිද්‍යා සාධක ආරක්ෂා වන පරිදි සැහැල්ලු වාහන ධාවනයට පමණක් අවසර දීම.

මෙම යෝජනා කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුව පැවති නමුත් අදාල පියවර ගෙන නොතිබුණි.

**(ඩ) අනුරාධපුර අරිප්පුව පිහිටා ඇති සංඝමිත්තාරාමය පවරා ගැනීම.**

---

මිරිසවැටිය පුරාවිද්‍යා රක්ෂිතය තුළ පිහිටි අක්කර 2 ½ ක පමණ ඉඩම හා මහේස්ත්‍රාත්තුමා භාවිතා කළ දෙමහල් නිවස 1990 අගෝස්තු 24 දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 113(20) යටතේ පුරාවිද්‍යා පර්යේෂණ කටයුතු සඳහා යොදවා ගැනීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත භාර දී තිබුණි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් 1990 දෙසැම්බර් 01 දින දසසිල් මාතාවන් සඳහා අධ්‍යාපන පීඨයක් ආරම්භ කිරීමට මෙම නිවස ලබාදී තිබූ නමුත් මාස 02 කට අඩු කාලයක් පමණක් ශාස්ත්‍රීය කටයුතු සිදු කර තිබුණි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ උතුරු මැද පළාත් කාර්යාලය පවත්වාගෙන යනු ලබන ස්ථානය කෞතුකාගාරයට සුදුසු පරිදි නිර්මාණය කරන ලද ගොඩනැගිල්ලක් වන අතර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට එහි අයිතියක් නොතිබුණි. දැනටත් නඩත්තු කටයුතු හා ආරක්ෂාව සැපයීම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සිදුකරන මහේස්ත්‍රාත් නිල නිවස පුරාවිද්‍යා කාර්යාලයකට සුදුසු බව සහකාර පුරාවිද්‍යා අධ්‍යක්ෂ විසින් කරුණු ඉදිරිපත් කර තිබුණත් එම ගොඩනැගිල්ල පවරා ගැනීමේ කටයුතු කඩිනමින් සිදු නොකිරීම කළමනාකාරිත්වයේ දූර්වලතාවයක් ලෙස නිරීක්ෂණය විය.

**(ත) අනුරාධපුර කෞතුකාගාරයේ ප්‍රදර්ශනයෙන් ඉවත්ව තිබූ මූර්ති ශාලාව**

---

මූර්ති ශාලාව අළුත්වැඩියා කටයුතු කරගෙන යාමට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත භාරදී තිබුණි. 2013 පෙබරවාරි 28 දින අනුරාධපුර මූර්ති ශාලා ගොඩනැගිල්ල අළුත්වැඩියාව සඳහා ගෙවා තිබුණු අත්තිකාරම් පියවීම සඳහා රු.207,990 ක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ආපසු ගෙවා තිබුණත් වියදම්වලට අදාල බිල්පත් හා වියදම් සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි හෝ වියදම් වාර්තාවක් හෝ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ප) සහකාර අධ්‍යක්ෂ නිල නිවාසය ඉදිකිරීමට යෝජිත භූමියේ අනවසර පදිංචිකරුවන් ඉවත් නොකිරීම**

---

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් අනුරාධපුර ජයන්ති මාවතේ පිහිටා ඇති පර්චස් 40 ක පමණ ඉඩමේ සහකාර අධ්‍යක්ෂ නිල නිවාසයක් ඉදිකිරීමට සුදුසු බවට යෝජනා වී තිබූ නමුත් එහි අනවසර පදිංචිකරුවන් ඉවත්කර නොතිබුණි.

**(ඛ) අනුරාධපුර විජයාරාම පුරාවිද්‍යා ස්මාරක සංකීර්ණය සංරක්ෂණය නොකිරීම.**

1931 මාර්තු 13 දින අංක 7834 දරන රජයේ ගැසට් පත්‍රය මගින් අනුරාධපුර විජයාරාම පුරාවිද්‍යා ස්මාරක සංකීර්ණය පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස නම් කර තිබුණි. මෙම ස්මාරක සංකීර්ණය අක්කර 22 ක පමණ භූමි ප්‍රදේශයක් පුරා විසිරී තිබුණු අතර මෙහි විශාල විහාර සංකීර්ණයක් තිබූ බවට පුරාවිද්‍යා සාධක සාක්ෂි දරයි. පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස නම්කර වසර 80 කට වැඩි කාලයක් ගත වී තිබුණද 2013 දෙසැම්බර් 31 දින වන විට සංරක්ෂණය සිදු නොවීම නිසා නිදන් හොරුන්ගෙන් සිදුවන හානි හා ගරාවැටීම් හේතුවෙන් තවදුරටත් විනාශයට පත්වෙමින් පැවතුණි. 2010, 2011 හා 2012 වර්ෂවලදී මෙහි ගරා වැටී ඇති දාගැබ සංරක්ෂණය කිරීමට ඇස්තමේන්තු සකස් කර තිබුණද ප්‍රතිපාදන සැළැසී නොතිබුණ නිසා සංරක්ෂණ වැඩ ආරම්භ කර නොතිබුණි. 2013 වර්ෂයේ සළසා තිබූ රු.2,104,637 ක ප්‍රතිපාදන ද, මාණික්කම්පිටිය චෛත්‍ය සංරක්ෂණය සඳහා වැයකර තිබූ අතර 2014 වර්ෂය සඳහා ද මෙම ආරාම සංකීර්ණය සංරක්ෂණය සඳහා ප්‍රතිපාදන සළසා නොතිබුණි.

**2.13 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 46 | 09 | 37 |
| (ii) | තෘතියික මට්ටම | 56 | 26 | 30 |
| (iii) | ද්විතියික මට්ටම | 737 | 430 | 307 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 1,603 | 1,267 | 336 |
| | **එකතුව** | **2,442** | **1,732** | **710** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 710 ක් පිරවීමට තිබූ අතර 2014 නොවැම්බර් 30 දින වන විට එය 594 දක්වා අඩු කර ගෙන තිබූ නමුත් ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 3. ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

### 3.1 විගණන විෂය පථය

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 05 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 3.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 3.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 3.4 සිට 3.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 05 ක් සඳහා සළසා තිබුණු රු.2,095,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 10 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 සිට සියයට 93 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 20801 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.519,626 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 3.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

### 3.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබූ නමුත් එම සැලැස්මෙහි පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) කෞතුකාගාරයේ විශේෂිත කාර්යයන් ඉටුකරන අංශ 14 ක් පමණ පැවතුණද, ක්‍රියාකාරී සැලැස්මේ එම එක් එක් අංශ විසින් ඉටුකිරීමට අපේක්ෂිත කාර්යයන් පිළිබඳ විස්තර ඇතුළත්ව නොතිබුණි.

(ආ) කෞතුකාගාරය විසින් පිළියෙල කළ අසම්පූර්ණ ක්‍රියාකාරී සැලැස්මට අනුරූපව භෞතික ප්‍රගති වාර්තාවද සකස් කර තිබුණු අතර එහි සඳහන් වන්නේ පොදුවේ කෞතුකාගාරයට අවශ්‍ය භාණ්ඩ හා සේවා මිලදී ගැනීම හා ඊට අදාල වියදම් විස්තර පමණි.

## 3.5 වත්කම් කළමනාකරණය

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජපන් සහයෝගීතා පදනම වෙතින් වසර 13කට පමණ පෙර පරිත්‍යාග වශයෙන් ලද සූක්ෂම සේයාපට ඒකකය සතු **Micro film scanner, Reader, Camera, printer** ඇතුළු යන්ත්‍ර හා උපකරණ 26 ක් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිත වත්කම් වශයෙන් වසර කීපයක සිට පැවතුණි.

(ආ) සූක්ෂම සේයාපට ඒකකයේ බොහොමයක් උපකරණ ක්‍රියාවිරහිතව පැවතීම නිසා සූක්ෂම සේයාගත කිරීමේ කටයුතු අඛන්ඩව සිදු නොවන බැවින් එම ඒකකය සඳහා වෙන්කළ වර්ග අඩි 2,911 ක් පමණ වූ බිම් ප්‍රමාණය ඌන උපයෝජිතව පැවතුණි.

(ඇ) වර්ෂ 2 1/2 කට අධික කාලයක සිට උද්‍යාන පාලක තනතුර පුරප්පාඩු වීම නිසා තණකොළ කැපීම සඳහා යොදාගන්නා සී පැන් ට්‍රැක්ටරය හා අදාල උපකරණ නිෂ්කාර්යව පැවතුණි.

**3.6 කාර්යසාධනය**

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්**

කොළඹ කෞතුකාගාරයේ පිහිටි පුස්තකාලය 1992 වර්ෂයේ සිට අධි ශ්‍රේණියේ දෙපාර්තමේන්තු පුස්තකාලයක් බවට පත්කර තිබුණි. මෙම කෞතුකාගාර පුස්තකාලය සතුව දශලක්ෂයකට අධික පොත්පත් ප්‍රමාණයක්ද, ජාතික වැදගත්කමින් යුතු ඉපැරණි ග්‍රන්ථ සම්භාරයක්ද, වෙළුම් 4000 කින් පමණ සැදුම්ලත් පුස්කොළ එකතුවක්ද තිබුණි. එම වටිනා ලේඛනවල ඇති තොරතුරු වෙනත් මාධ්‍යක තැන්පත් කර ආරක්ෂා කිරීමේ අරමුණින් සූක්ෂම ඡායාගත කිරීම සිදු කර තිබුණත්, 2013 දෙසැම්බර් 31 දින වන විට එයින් පොත් 1120 ක් හා පුස්කොළ පොත් 768 ක් පමණක් සූක්ෂම ඡායාගත කර තිබුණි.

**3.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය අතර 2011 අගෝස්තු 10 දින ඇති කර ගත් බදු ගිවිසුමට අනුව අවුරුදු 10 ක කාලයක් සඳහා ජාතික කෞතුකාගාර පරිශ්‍රයේ ඇති දෙමහල් ගොඩනැගිල්ලේ වර්ග අඩි 8,000 කින් යුත් භූමි ප්‍රමාණය හා ඊට අදාළ පොදු පහසුකම්ද සමග කෞතුකාගාර සමරුහලක් හා ආපනශාලාවක් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට බදු පදනම මත ලබාදී තිබුණි. අදාල බදු ගිවිසුම හා ලක්සල පවත්වා ගෙනයාමේ කටයුතු සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බදු ගිවිසුමේ 07 වන වගන්තිය අනුව ලක්සල ආයතනය පවත්වා ගෙන යනු ලබන සමරු රහහල හා ආපන ශාලාව විවෘත නොකරන සෑම අවස්ථාවකදීම එහි ආරක්ෂාව බදුකරු විසින් ලබා දිය යුතු බව සඳහන්ව තිබුණි. ඒ අනුව බදු දී තිබුණු දේපලවලට ආරක්ෂාව සැලසීමේ අමතර වගකීමක්ද දෙපාර්තමේන්තුවට පැවැරී තිබුණි.

(අ) මෙම පරිශ්‍රයේ ඉදිකර තිබුණු කරත්ත මැදිරිය පවත්වා ගෙනයාම ලක්සල ආයතනයට බදු ගිවිසුම මගින් පවරා දී නොතිබුණි. එම මැදිරිය ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට ලක්සල ආයතනය විසින් 2014 ඔක්තෝබර් 03 දින දක්වා භාරදී නොතිබුණි. ලක්සල ඉදිකළ දෙමහල් නිල නිවස භාරදීමට කටයුතු කර තිබුණද මෙම කරත්ත මැදිරියේ යතුරු ලක්සල භාරයේ තබාගෙන තිබුණි.

(ඇ) බදු ගිවිසුමේ 09 වන වගන්තියට අනුව ලක්සල ආයතනය විවෘතව තැබිය හැකි වේලාව පෙ.ව. 8.00 සිට ප.ව. 8.00 දක්වා වන නමුත් ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ සභාපති විසින් ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ අමතන ලද 2014 අගෝස්තු 08 දිනැති ලිපියට අනුව මෙම ලක්සල ප්‍රදර්ශනාගාරය දිනපතා පෙ.ව. 6.00 සිට රාත්‍රී 12.00 දක්වා විවෘතව තබන බව සඳහන්කර තිබුණි.

(ඈ) ලක්සල ආයතනය පවත්වා ගෙන යන ගොඩනැගිලි පරිශ්‍රයට මුහුණලා ඉදිකර තිබුණු කරත්ත මැදිරිය 2013 දෙසැම්බර් 31 දින වන විට ප්‍රදර්ශන මට්ටමේ පැවැතුණි. කෞතුකාගාරයට අයත් ඉපැරණි කරත්ත 08 ක් ප්‍රදර්ශනය සඳහාද, ලක්සල ආයතනයට අයත් කරත්ත 03 ක් අලෙවිය සඳහාද, එකම මැදිරියේ තබා තිබුණි. මෙම මැදිරියේ අයිතිය කෞතුකාගාරය සතු වුවත්, එහි යතුර කෞතුකාගාරයට භාර දී නොතිබුණු අතර එහි නඩත්තු කටයුතු ලක්සල ආයතනය විසින් සිදු කර තිබුණි. ආයතන දෙකක අරමුණු උදෙසා පැරණි භාණ්ඩ තබා ගැනීම එකම මැදිරියක් තුළ වීම නිසා ඒවායේ වගකීම් හා ආරක්ෂාව පිළිබඳව ගැටළු මතුවී තිබුණි.

## 3.8 පාඩු හා හානි

------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 මාර්තු 16 දින කොළඹ ජාතික කෞතුකාගාරයේ සිදු වූ සොරකම නිසා අස්ථානගතව තිබූ කෞතුක භාණ්ඩ ප්‍රමාණය 221 ක් වූ අතර එම භාණ්ඩවල වටිනාකම රු.4,440,140 කට තක්සේරු කර තිබුණි. ඉන් භාණ්ඩ 94 ක් මුල් තත්ත්වයෙන්ම භාණ්ඩ කොටස් හා ගල් වශයෙන් 57 ක් ද, නැවත හමු වී තිබුණු අතර අනෙකුත් භාණ්ඩ කපා, තලා දැමීම නිසා විනාශයට පත්ව තිබුණි. මෙම හානියට පත් කෞතුක භාණ්ඩ අධිකරණය භාරයේ තිබුණු අතර ඒවායේ වටිනාකම තක්සේරු කර නොතිබුණි.

(ආ) කොළඹ කෞතුකාගාරයෙහි ප්‍රධාන තරප්පු පෙලෙහි වම්පස කොටස 2013 මාර්තු 28 දින කඩාවැටීම හේතුවෙන් එය අළුත්වැඩියා කරන තෙක් පළමු මහලේ ප්‍රදර්ශන මැදිරි මහජනතාවට විවෘතව නොතැබීම නිසා 2013 අප්‍රේල් 01 දින සිට දේශීය, විදේශීය, වැඩිහිටි, ළමා හා පාසල් සිසුන් යන සියළුම වර්ගවල ප්‍රවේශපත්‍ර මිල සියයට 50 කින් පමණ අඩුකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කොළඹ කෞතුකාගාරය නැරඹීමට 2012 වර්ෂයට වඩා 2013 වර්ෂයේදී 4,556 දෙනෙකු පැමිණියද, මාස 09 ක කාලයක් අඩු ගාස්තු ප්‍රමාණයක් අයකිරීම නිසා කොළඹ කෞතුකාගාරයේ ප්‍රවේශපත්‍ර ආදායම 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී රු.3,811,940 කින් අඩුවී තිබුණි.

(ii) කොළඹ කෞතුකාගාරය නැරඹීමට 2013 අප්‍රේල් 01 සිට දෙසැම්බර් 31 දක්වා පැමිණි නරඹන්නන්ගෙන් නියමිත ගාස්තුව අයකර ගැනීමට නොහැකි වීමෙන් කෞතුකාගාර දෙපාර්තමේන්තුවට අහිමි වූ ආදායම රු.6,747,595 ක් වි තිබුණි.

3.9 **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (v) ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 04 | 07 |
| (vi) තෘතියික මට්ටම | 04 | 01 | 03 |
| (vii) ද්විතියික මට්ටම | 114 | 71 | 43 |
| (viii) ප්‍රාථමික මට්ටම | 205 | 191 | 14 |
| එකතුව | 334 | 267 | 67 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 67 ක් පිරවීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

(ආ) 2012 මාර්තු 16 දින කොළඹ කෞතුකාගාරයේ සිදු වූ කෞතුක භාණ්ඩ සොරකමෙන් පසු කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2013 මැයි 23 දින අනුමත කර තිබූ ප්‍රධාන ආරක්ෂක නිලධාරී තනතුර හා ආරක්ෂක සහායක තනතුරු 03 ක් සඳහා බඳවා ගැනීම 2014 ඔක්තෝබර් 15 දින දක්වාත් සිදුකර නොතිබුණි.

4. **ශීර්ෂය 209 - ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව.**

4.1 **විගණන විෂය පථය**

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 23 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

4.2 **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

4.3 **විගණන නිරීක්ෂණය**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 4.4 සිට 4.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) ගිණුම් ඉදිරිපත් කිරීම
-------------------------
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් විෂය අංක 20901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය 2014 මාර්තු 31 දින වන විට විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එය මාස 03 කට අධික ප්‍රමාදයකින් පසුව 2014 ජූලි 16 දින ඉදිරිපත් කර තිබුණි.

(ආ) අයවැය විචලනය
--------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.මිලියන 13 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 12 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 සිට සියයට 95 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම්**
-----------------------
වර්ෂ 02 ක් ඉක්මවූ රු.4,337,517 ක් තැන්පත් ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඈ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම.**
--------------------------------------------
විෂය අංක 20901 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.552,746 ක් වූ අතර, එම හිඟහිට් ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**4.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**
-------------------------------------

**4.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**
-------------------------------
2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රම්පාදන සැලැස්ම 2013 අගෝස්තු 18 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**4.5 වත්කම් කලමනාකරණය**
--------------------------
**දෙපාර්තමේන්තුවේ වත්කම් පිළිබඳව සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

**----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ විවිධ අංශ සඳහා අවශ්‍ය වානේ රාක්ක තැනීමට අවශ්‍ය උපාංග ලෙස 2012 දෙසැම්බර් 31 දින රු. 1,958,000 ක් වටිනා වානේ තට්ටු හා ඒ සම්බන්ධ උපකරණ තොගයක් මිලදීගෙන තිබුණි. එහෙත් මෙම උපාංග දෙපාර්තමේන්තුවට ලැබී වර්ෂයකට වැඩි කාලයක් ගතවී තිබුණද මින් ප්‍රයෝජනයට ගෙන තිබුණේ සියයට 10 ක ප්‍රමාණයක් පමණි.

(ii) 2008 පෙබරවාරි පෞද්ගලික සමාගමකින් රු.3,050,000 කට මිලදී ගෙන තිබූ **Kodak File Master Scanner** යන්ත්‍රය 2013 මැයි සිට 2014 සැප්තැම්බර් දක්වා දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා භාවිතා කර නොතිබූ අතර ඉන් පසුවද මෙම යන්ත්‍රය ඌන උපයෝජිතව පැවති අතර මෙම යන්ත්‍රය වෙනුවෙන් වාර්ෂික සේවා ගාස්තුව වශයෙන් රු.305,800 ක් ගෙවා තිබුණි.

(iii) දෙපාර්තමේන්තුව සඳහා රු. 638,329,722 ක් වැයකර මහල් 04 කින් සමන්විත නව ගොඩනැගිල්ලක් ඉදිකර තිබූ අතර එය 2012 දෙසැම්බර් විවෘත කර තිබුණි. එහි මුළු වර්ග ප්‍රමාණය වූ වර්ග මීටර් 6,836 න් දෙපාර්තමේන්තුවේ විවිධ අංශ සඳහා කාර්යාල කටයුතු පවත්වාගෙන යාමට වර්ග මීටර් 3,809 ක් වෙන්කර තිබූ නමුත් එම කාර්යාල පරිශ්‍රයෙන් වර්ග මීටර් 2,322 ක් හෙවත් සියයට 60 ක ප්‍රමාණයක් 2013 දෙසැම්බර් 31 දින වන විටද ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම.**

**-------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 31 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් 2014 මැයි 31 දින වන විටත් විගණනය වෙත එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. අවසන් වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර තිබුණේ 2009 වර්ෂය වෙනුවෙනි.

(ii) මුදල් රෙගුලාසි 751(1) ප්‍රකාරව රජයේ දෙපාර්තමේන්තුවලට ලැබෙන සියළුම භාණ්ඩ බඩු ලේඛන පොතෙහි ඇතුළත් කළයුතු වුවත්, 2010 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් දක්වා

මිලට ගන්නා ලද භාණ්ඩ තොග පොත්වල ඇතුළත් කර නොතිබුණි. 2013 වර්ෂයේ අත්පත් කරගත් ඉන්වෙන්ට්‍රි අයිතමද ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

**4.6 අනුකූල නොවීම්**

-----------------

2013 ජනවාරි 31 දිනැති අංක 157 (i) දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව රජයේ සේවකයෙකු සඳහා ගෙවිය හැකි උපරිම ආපදා ණය මුදල තීරණය කිරීමේදී 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන අනුව ක්‍රියා කළ යුතු බවත් එයින් පරිබාහිරව ගෙවීම් සිදුකර ඇත්නම් එසේ සීමාවන් ඉක්මවා ගෙවා ඇති මුදල් වහාම ආපසු අයකර යුතු බව සඳහන් කර තිබුණි. එයට පටහැනිව රු.250,000 ක සීමාව ඉක්මවා ආපදා ණය මුදල් ලබාදීම නිසා දෙපාර්තමේන්තු නිලධාරීන් දෙදෙනෙකුගේ 2013 දෙසැම්බර් 31 දිනට ආපදා ණය ශේෂයන් රු.401,885 ක් හා රු.346,036 ක් වී තිබුණි.

**4.7 කාර්යසාධනය**

---------------

2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකල ප්‍රධාන කාර්යයන්**

---------------------------------------------------

2012 දෙසැම්බර් 18 දින විවෘත කළ ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ නව ගොඩනැගිල්ල සඳහා 2013 වර්ෂය වෙනුවෙන් ගෘහ භාණ්ඩ මිලදී ගැනීමට රු.මිලියන 225 ක් ප්‍රතිපාදන සළසා තිබුණි. 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 40.2 ක් වී තිබුණත් ඉහත ප්‍රතිපාදනයෙන් රු.මිලියන 13 ක් වෙනත් වැය විෂයකට මාරුකර තිබුණි. ඒ අනුව නව ගොඩනැගිල්ල සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේ මූල්‍ය ප්‍රගතිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 19 ක් දක්වා අඩු මට්ටමක පැවතුණි.

**(ආ) සැලසුම් කිරීම.**

---------------

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම.**

---------------------------------------------------------

පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකර තිබුණු බව නිරීක්ෂණය විය.

(i) ප්‍රදර්ශන හා දැනුවත් කිරීමේ වැඩසටහන් යටතේ ප්‍රදර්ශන ඉලක්කයන් ඉටුකරගෙන තිබුණද, තෝරාගත් දිස්ත්‍රික්කවල දැනුවත් කිරීමේ වැඩසටහන් 02 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) ලේඛන කළමනාකරණය සහ සංරක්ෂණය පිළිබඳ පස්දින පුහුණු වැඩසටහන් 04 ක් පැවැත්වීමට සැලැසුම් කර තිබුණද, 2013 වර්ෂය තුළදී පුහුණු වැඩසටහන් 02 ක් පමණක් පවත්වා තිබුණි.

(iii) අධිලේඛන වෙළුම් 36 ක් සංරක්ෂණය කිරීමට සැලැසුම් කර තිබුණද, 2013 වර්ෂය තුළදී වෙළුම් 26 ක් පමණක් සංරක්ෂණය කර තිබුණි.

(iv) අධිලේඛනවල ඇති තොරතුරු වෙනත් මාධ්‍යයක තැන්පත් කර ආරක්ෂා කිරීම, අධිලේඛන පරිශීලනය කරන මහජනතාවට හා පර්යේෂකයන්ට පහසුවෙන් තොරතුරු ලබාගැනීමට අවස්ථාව සැලසීම හා මුල් පිටපත් නිතර භාවිතා කිරීම අවම කිරීමේ අරමුණින් පුවත්පත් සූක්ෂම ඡායාගත කිරීම සිදු කර තිබුණි. මේ යටතේ පුවත්පත් 04 ක අනාවරණ 100,000 ක් සූක්ෂම ඡායාගත කිරීමට සැලැසුම් කර තිබුණද, 2013 වර්ෂයේදී අනාවරණ 86,481 ක් පමණක් සූක්ෂම ඡායාගත කිරීම සිදුකර තිබුණි.

(v) ප්‍රකාශන එළිදැක්වීම යටතේ ප්‍රකාශන 02 ක් නැවත මුද්‍රණය කිරීමට සහ ප්‍රකාශන 02 ක් අළුතින් මුද්‍රණය කිරීමට සැලැසුම් කර තිබුණද, 2013 වර්ෂය තුළදී ඒවා නියමිත පරිදි එළිදක්වා නොතිබුණි.

(vi) රජයේ සන්නස් සහ විහාර දේවාල ඉඩම් ලේඛන 400-500 (7000-8000) අංකිත කිරීමේ සැලැස්මක් ලේඛන අංකිත කිරීම යටතේ වැඩසටහනට ඇතුළත් කර තිබුණත්, ආයතනයේ සංවර්ධන ප්‍රගතිය තුළ මෙය දක්වා නොතිබුණි. එසේම සැලැසුම් කළ ටයිම්ස් එකතුවේ ඇති පුවත්පත් කැපුම් 55,000 ද අංකිත කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.

## 4.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

### (අ) ගැලපුම් කළයුතු ශේෂ

දෙපාර්තමේන්තු විසින් 2013 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| ගැලපුම් පිළිබඳ විස්තරය | | කාල විශ්ලේෂණය | | | එකතුව |
|---|---|---|---|---|---|
| | | මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු | වර්ෂ 01 ට වැඩි වර්ෂ 03 ට අඩු | වර්ෂ 03 ට වැඩි | |
| | | රු. | රු. | රු. | රු. |
| (i) | උපලබ්ධි නොවූ තැන්පතු | 61,256 | 72,535 | 3,074 | 136,865 |
| (ii) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 7,792 | 1,738,230 | 408,135 | 2,154,157 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **(iii)** | හඳුනා නොගත් හර | 2,812,564 | 1,956,969 | 382,087 | 5,151,620 |
| **(iv)** | හඳුනා නොගත් බැර | 126,061 | 1,316,924 | 5,486,825 | 6,929,810 |

**(ආ) නිවැරදි නොකරන ලද බැංකු ගනුදෙනු**

පෙර විගණන විමසුම්වලින් පෙන්වා දී තිබුණද, නිවැරදි නොකරන ලද පහත සඳහන් බැංකු ගනුදෙනු 2014 ජුනි බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කිරීමේදී ද නිරීක්ෂණය විය.

(i) 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොකළ චෙක්පත් 3 ක එකතුව රු. 747,080 ක් විය.

(ii) 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 70 ක එකතුව රු. 130,769 ක් විය.

(iii) 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා හඳුනා නොගත් ගෙවීම් 12 ක එකතුව රු.2,236,135 ක් විය.

(iv) 2011 සහ 2012 වර්ෂවල හඳුනා නොගත් ලැබීම් 4 ක එකතුව රු.1,332,978 ක් විය.

## 4.9 මානව සම්පත් කළමනාකරණය

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 04 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 41 | 06 | 35 |
| (iii) | ද්විතියික මට්ටම | 132 | 55 | 77 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 74 | 49 | 25 |
| | එකතුව | 253 | 114 | 139 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 139 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**(ආ) දෙපාර්තමේන්තුවට අත්‍යවශ්‍ය තනතුරු රැසක් පුරප්පාඩුව පැවතීම.**

---

දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය කටයුතු පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය දෙපාර්තමේන්තුගත තනතුරු රැසක 2014 ජුලි 31 දින වන විටත් පුරප්පාඩු පැවැතුණි. ඒ අනුව ලේඛන විමර්ශන නිලධාරී, භාෂා පරිවර්තක, අධිලේඛන සහකාර, ලේඛන සූචිගත කිරීමේ නිලධාරී, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර සහ පොත් බැඳුම්කරු තනතුරු සියයට සීයක්ම පුරප්පාඩු පැවැතුණි. සහකාර ලේඛනාරක්ෂක, අධිලේඛන පර්යේෂණ සහකාර, ලේඛනාරක්ෂක නිලධාරී, සහකාර ලේඛන ප්‍රතිරූපන ශිල්පී, ලේඛන ප්‍රතිසංස්කාරක, නාමාවලි සහකාර, ශ්‍රව්‍ය දෘෂ්‍ය කාර්මික තනතුරුවල සියයට 50 කට වැඩියෙන් පුරප්පාඩුව පැවතුණි. මේ නිසා දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමේදී මෙන්ම, සමස්ථ කාර්යසාධනය ඉහල නංවා ගැනීමේදී ද ගැටළු මතු වී තිබුණි.